රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2022

මගේ අංකය : F/FR/03/BRCir.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.09. 23

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

<u>රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ</u>
<u>(රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී - 20.02.01.01)</u>

උක්ත මැයෙන් 2021.10.06 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2021 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය මඟින් ඔබ සේවා ස්ථානයේ ගරු අමාත්‍යවරුන්ට සහ නිලධාරීන් වෙත වෙන්කර දී තිබෙන පහත දක්වා ඇති රජයේ නිවාස,

| | නිල නිවාස වර්ගය | කේතය |
|---|---|---|
| (i) | රජයේ බංගලා නිවාස | A |
| (ii) | ලෝරිස් නිවාස | B |
| (iii) | නිල පියස නිවාස | C |
| (iv) | සමූළ නිවාස | D |
| (v) | සාද නිවාස | E |
| (vi) | ගෝතමී පාර නිවාස | F |
| (vii) | ජයවඩනගම නිවාස | G |

සඳහා මාසිකව අදාළ නිලධාරීන්ගෙන් අය කළ නිවාස කුලී මුදල් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතාංකන (20.02.01.01) වෙත බැර වී ඇති මුත්, එයට අදාළ වාර්තා විධිමත්ව මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොමැති බැවින් හිඟ නිවාස කුලිය ලෙස වාර්තා වී ඇත. එබැවින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2021හි දක්වා ඇති REPO/01 යන ආකෘති පත්‍රයට අමතරව මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය ද (REPO/03) නිසි ලෙස සම්පූර්ණ කර, මේ දක්වා මෙම අමාත්‍යාංශය වෙත ඒවා නොමැති තොරතුරු යාවත්කාලීන කර මාසිකව අයවීම් පිළිබඳ තොරතුරු ද සමඟ ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

03. මෙසේ ඔබ විසින් අප වෙත ඉදිරිපත් කළ යුතු උක්ත ආදායම් වාර්තාවන් සෑම මසකම 15 වන දිනට පෙර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් තැපැල් ලිපිනයට මෘදු පිටපතක් ද සහිතව මෙම අමාත්‍යාංශයෙහි "ප්‍රධාන මූල්‍ය නිලධාරී" වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එම්. එම්. පී. කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය :- 0112-056580
ෆැක්ස් අංකය :- 0112- 695723
විද්‍යුත් ලිපිනය:- fin.report.pubad@gmail.com

**REPO 03**

**ගණකාධිකාරී 1 ශ්‍රේණිය, (මූල්‍ය වාර්තාකරණ හා අධීක්ෂණ)**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,**
**නිදහස් චතුරශ්‍රය,**
**කොළඹ 07.**
**2022.**

<u>මාසික නිවාස කුලී ආකෘති පත්‍රය</u>

**අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව : ………………………………………………………………………**

| නිවාස අංකය | කේතය (A,B,C,D,E,F,G) | නිවාස හිමියාගේ නම | මාසය | මාසික වැටුප (රු.) | අයකළ යුතු මාසික කුලිය (රු.) | අය කරන ලද මාසික කුලිය (රු.) | හිඟ කුලිය (සටහන 1) (රු.) | මුළු කුලිය (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව | | | | | | | | |

**සටහන 1**
**හිඟ කුලිය මාසිකව වෙන් වෙන් වශයෙන් දක්වන්න.**

**ඉහත දක්වා ඇති නිවාස කුලී පිලිබඳ තොරතුරු අපගේ මාසික ගිණුම් සාරාංශය සමඟ සැසඳෙන බව තහවුරු කරමි.**

**…………………………………..**
**ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී**